**ලංකාපුර ප්‍රාදේශීය සභාව**
**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 24 දිනද, සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
----------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට **ලංකාපුර** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හි භ සේවක ණය ශේෂය රු62,305.ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි ලෙස ගිණුම්ගත කල යුතු වේ. | නිවැරදි කර ගැනීමට නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ නිලධාරී අත්තිකාරම් ශේෂය රු. 36,000ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නොපියවූ නිලධාරී අත්තිකාරම් ශේෂය නිවැරදි ලෙස ගිණුම්ගත කල යුතු වේ. | නිවැරදිව ගිණුම්ගත කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත |
| (iii) | සමාලෝචිත වර්ෂයට අදාළව හඳුනාගෙන තිබූ උසාවි දඩ ආදායම් රු. 683,416 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාළ සියලු ආදායම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. | 2019 වර්ෂයේ මෙම වරද නිවැරදි කරගෙන අවශ්‍ය ගැලපීම් සිදුකර ඇති බව දන්වා ඇති අතර වර්ෂයට අදාළ නිශ්චිත උසාවි දඩ වටිනාකම් |

| | | | |
|---|---|---|---|
| | | | ලබාගැනීමේ දැඩි අපහසුතාවයක්ඇත. |
| (iv) | ප්‍රාදේශීය සභාව සතු 138 ජයබිම පොදු සුසාන භූමියේ වටිනාකම තක්සේරුකර ගිණුම්වලට ගෙන නොතිබුණි. | ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම් තැබිය යුතුවේ. | සියළු වත්කම් 2019 වර්ෂය තුළ තක්සේරු කර නිවැරදි වටිනාකම් ගිණුම්ගත කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. |
| (v) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා වෙන් කිරීමක් සිදුකර නොතිබුණි. | වර්ෂයට අදාල වියදම් සඳහා වෙන් කිරීම් සිදුකල යුතු වේ. | නිශ්චිත වටිනාකම් තහවුරු කරගත නොහැකි නිසා වෙන්කිරීමක් සිදුනොකළ බව දන්වමි. |
| (vi) | සමාලෝචිත වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාල සියලු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. | 2019 වර්ෂයේ නිවැරදි කරගන්නා ලෙස නිලධාරීන්ට දන්වා ඇති අතර වර්ෂයට අදාළ මුද්දර ගාස්තු<br><br>වටිනාකමනිශ්චිතව හඳුනාගැනීමේ අපහසුතාවයක් ඇත. |
| (vii) | පිබිදෙමු පොළොන්නරුව සංවර්ධන වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය තුළ ඉටුකල ව්‍යාපෘති13 කට අදාලව දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හ ගෙවිය යුතු බිල්පත් වටිනාකම රු.7,545,410 ක් කර්මාන්ත ණයගැති හා කර්මාන්ත ණයහිමි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ණයගැතියන් හා ණයහිමියන් නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. | පිළිතුරු ලැබී නොමැත. |
| (viii) | සමාලෝචිත වර්ෂයේ හරස් සටහන් මගින් ගලපන ලද වියදම් රු.2,465,375 ක් සමුච්චිත අරමුදලට හරකර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ වියදම් වර්ෂයේ ලාභයට ගැලපීමක් සිදුකළ යුතු වේ. | නිවැරදි කරගන්නා ලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට නිළධාරී අත්තිකාරම් ලේඛනයේ ශේෂය රු.113,225 ක් වුවත් එය මූල්‍ය ප්‍රකාශනවල රු. 20,000 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු. 93.225 ක වෙනසක් පැවතුණි. | නිලධාරි අත්තිකාරම් ලේඛනය යාවත්කාලීන කල යුතු අතර නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ. | නිවැරදි කරගන්නා ලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදීඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි ශේෂයන් 31 කට අදාළව උපලේඛනවල දැක්වෙන ශේෂයන්ගේ වටිනාකම් හා ස්ථාවර වත්කම් ලේඛනයෙහි දැක්වෙන වටිනාකම් අතර රු.1,646,466 ක වෙනසක් පැවතුණි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කලයුතු අතර නිවැරදි වටිනාකම් උපලේඛනයට ගත යුතුයි. | ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදි කරගන්නා ලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. |
| (iii) | ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම අතර රු.6,401,694 වෙනසක් පැවතුණි. | වෙනසට හේතුව හඳුනාගෙන නිවැරදි කරගත යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කරගැනීමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.5,325,526 ක් වූ ගිණුම් විෂයන් 04ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | සභාව භුක්ති විඳින ඉඩම් 14 ක් සඳහා හිමිකම සනාථ කළහැකි ලියවිලි නොමැත. හඳුනානොගත් හිඟහිටි වටිනාකම් තහවුරු කරගත හැකි සාක්ෂි නොමැති බවත් සේවක ඇපතැන්පත් ලේඛනයක් පවත්වාගෙන නොමැති බැවින්එම ලේඛනය සිට 2019 |

පවත්වාගෙන යාමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

1.4 අනුකූල නොවීම
--------------------
නීති ,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | දරන 15 අංක 1987 දේශීය සභා පනතප්‍ර | | | | |
| (i) | 19(2)වගන්තිය | - | සභාව විසින් පවත්වාගෙන යන සහල් පිටි නිෂ්පාදන බේකරිය , අලෙවිසැල සහ නිවාඩු නිකේතනය සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | වාණිජ හෝ කර්මාන්ත ව්‍යවසායන් සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුවේ. | ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දී ඇත. |
| (ii) | 134 වගන්තිය | - | 2012 ඔක්තෝබර් 31 දින තල්පොත නගරය දියුණු කළ ප්‍රදේශයක් ලෙස ගැසට් කර 2013 නොවැම්බර් 28 එම ප්‍රදේශයෙන් වරිපනම් අයකර ගැනීමට සභා සම්මත කර 2014 | තල්පොත ප්‍රදේශයෙන් වරිපනම් අයකර ගැනීමට අවශ්‍ය ඉදිරි පියවර ගතයුතු වේ. | 2017 අගෝස්තු 18 දින තක්සේර සඳහා තක්සේරු දෙපාර්තමේන් තුවටඉදිරිපත් කර ඇති අතර ලිඛිතව හා වාචිකව මේ |

| | | | | |
|---|---|---|---|---|
| | | අගෝස්තු 29 දින විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන තිබුණු නමුත් මෙතෙක් වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | පිළිබඳව ඔවුන් දැනුවත් කර ඇත. |
| **(ආ)** | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23(අ) වගන්තිය | සභා බල ප්‍රදේශයට අයත් කර්මාන්ත 17 ක පරිසර බලපත්‍ර කල් ඉකුත් වී වසර 04 ත් 07 ත් අතර කාලයක් ගත වී තිබුණද සුදුසු කර්මාන්ත හඳුනාගෙන නව බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍යක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පරිසර බලපත්‍ර නොමැතිව සිදුකරන කර්මාන්ත සම්බන්ධනේ නෛතික පියවර ගතයුතු වේ. | ජාතික පාරිසරික පනතේ 23(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කරන ලෙසත් පරිසර බලපත්‍රෙ කල් ඉකුත් වී ඇති කර්මාන්ත සඳහා පරීක්ෂා කර බලා නව බලපත්‍ර නිකුත් කිරීමටත් නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |
| **(ඇ)** | දේශීය සභාප්‍රා 1988 මූල්‍යා) රීති(පරිපාලන ------------------------ -- | | | |
| **(i)** | රීති අංක 59-63 | - සභා බල ප්‍රදේශය තුළ සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත,වෙළඳ ව්‍යාපාර ලැයිස්තුවක් පිළියෙළ කර නොතිබුණි. | සභා බල ප්‍රදේශය තුළ සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳ ලැයිස්තුවක් සෑම වර්ෂයකම මාර්තු 31 දිනට පෙර පිළියෙළ කළයුතුවේ. | වර්ෂයේ සිට 2019 සමීක්ෂණ සිදුකර ලේඛනයක් වාර්ෂිකව පිළියෙල කරනලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. |
| **(ii)** | රීති අංක 203 | 2019 මැයි 31 දින වන විටත් 2018 වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණය | භාණ්ඩ සමීක්ෂණයක් නියමිත කාල වකවානුව තුළ සිදුකල යුතු වේ. | පුස්තකාල හතරට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු විගණිත දින වන විට අවසන් කර |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | අවසන්කර නොතිබුණි. | | තිබුණු අතර අනෙක් අංශයන්හි භාණ්ඩ සමීක්ෂණ ඉදිරි සති කීපය තුළ අවසන් කරන බව දන්වමි. |
| **(ඈ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය --------------------- | | | | . |
| **(i)** | 2015ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය- මුදල් චක්‍රයලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි371(5) | 215,225 | කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබා ගත් අත්තිකාරම් මුදල පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂවල අවස්ථා 10කදී ලබා දී තිබූ රු.215,225 ක් වටිනා අත්තිකාරම් මුදල් මාස ½ සිට මාස 43 ½ දක්වා කාල පරාසයක් ප්‍රමාද වී පියවා තිබුණි. | ලබාගන්නා ලද අත්තිකාරම් නියමිත කාලය ඇතුලත පියවිය යුතුවේ. | කාර්යය නිමකළ වහාම අත්තිකාරම් මුදල් පියවන ලෙස හා අත්තිකාරම් මුදල් පියවීම සිදුනොකළ නිලධාරීන් සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇත. |
| **(ii)** | මු.රෙ.751 | 142,900 | සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් රු.142,900 ක් වටිනා භාණ්ඩ, බඩු වට්ටෝරු ලේඛනවල ඇතුළත් කර නොතිබුණි. | මිළදී ගනු ලබන සියලුම භාණ්ඩ බඩු වට්ටෝරු ලේඛනවලට ඇතුලත් කල යුතුවේ. | අවශ්‍ය උපදෙස් ලබාදුනිමි. |
| **(ඉ)** | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ --------------------- | | | | |
| | 2015 දෙසැම්බර් 04 දිනැති අංක NCP/PL/AC/04/01/02 දරන ලිපිය | 33,535 | අනුමත ඉන්ධන සීමාව ඉක්මවා සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා | ඉන්ධන භාවිතය අනුමත සීමාව තුළ විය යුතුවේ. | බල ප්‍රදේශයේ රාජකාරි හා ප්‍රදේශයෙන් බැහැර රාජකාරි කටයුතු සඳහා ඉන්ධන |

| | | |
|---|---|---|
| | මාසවලට අදාළව ලේකම්වරයා විසින් භාවිතා කළ කැබ් රථය සඳහා ඩීසල් ලීටර් 353ක් සඳහා රු.33,535ක් වැයකර තිබුණි. | භාවිත කර ඇත.ප්‍රදේශයේ සංවර්ධන කටයුතු බහුලව සිදුවීමත් එම ව්‍යාපෘති අධීක්ෂණය කිරීමට මෙම රථය භාවිතාකිරීමට සිදුවීමත් බලපා ඇත. |

**1.5** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
--------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍යප්‍රකාශනවල දක්වා තිබෙන ලැබිය යුතු ගිණුම් ශේෂ 03ක වටිනාකම රු.1,607,190 ක් වූ අතර දීර්ඝ කාලයක් තිස්සේ හිගව ඇති මෙම මුදල් අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පොලීසියට පැමිණිලි කර ඇති අතර කරන ලද පරීක්ෂා අනුව බදුකරුවන් හයදෙනෙකු විසින් ගෙවීම් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. බදුකරුවන් තිදෙනෙක් විදේශගත වී ඇත. හයදෙනෙකු පදිංචිය අතහැර ගොස් ඇති බව තහවුරු කරගෙන ඇත. |
| (ආ) | වසර 11 සිට වසර 19 කට අධික කාලයක් තිස්සේ අයකර ගත හැකි උපයෝගී සේවා යටතේ දක්වා තිබූ රු. 117,194 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිරවුල් කළයුතු ගිණුම්කරණ දෝෂ හා කපාහල යුතු ශේෂ සම්බන්ධ වාර්තාවක් අනුමැතිය සඳහා ඉදිරිපත් කරඇත. |

## 2 මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.5,134,193 වු අතර,ඊට අනුරූපීව **ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,566,537 ක් විය.**

## 2.2 ආදායම් පරිපාලනය

ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

**සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන් තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැ 31 . දිනට මුළු හිඟය | ඇස්තමේන් තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැ 31 . දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 70,000 | 81,750 | 81,750 | - | 250,020 | 85,000 | 85,000 | - |
| කුලී | 6,955,286 | 9,771,470 | 9,602,530 | 2,232,265 | 11,609,867 | 11,814,778 | 11,738,578 | 2,638,209 |
| බලපත්‍ර ගාස්තු | 1,307,000 | 1,959,890 | 1,959,890 | - | 1,330,650 | 1,267,075 | 1,267,075 | - |
| වෙනත් ආදායම් | 14,484,470 | 18,311,502 | 14,133,660 | 7,363,801 | 15,877,095 | 11,391,592 | 6,413,207 | 5,355,702 |
| එකතුව | 22,816,756 | 30,124,612 | 25,777,830 | 9,596,066 | 29,067,632 | 24,558,445 | 19,503,860 | 7,993,911 |

**2.2.1** ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පෙර වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.29,067,632 ක් වුවද සමාලෝචිත වර්ෂයේඇස්තමේන්තුගත ආදායම රු.22,816,756 ක් වූයෙන් එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 21 කින් අඩු වී තිබුණි. | ඇස්තමේන්තුගත ආදායම අඩුවීමට බලපෑ හේතු සොයාබලා අවශ්‍ය පියවර ගත යුතු වේ. | 2018 වර්ෂයේ ඇස්තමේන්තු සකස් කිරීමේදී පෙර වර්ෂ කීපයක තත්‍ය ආදායම් පදනම් කරගෙන ඇස්තමේන්තු කර ඇති අතර 2017 වර්ෂයට එවැනි පදනමක් රහිතව ඇස්තමේන්තු සකස්කරඇත. |

**2.2.2** වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රැස්කල බදු ආදායම රු.81,750 ක් වූ අතර එය පෙර වර්ෂයට වඩා සියයට 3 ක් අඩු වී තිබුණි. | ආදායම වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂය තුළ වැඩි ආදායමක් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.3** කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කුලී ආදායම රු.2,232,265 ක් හිඟව පැවතුණි. | හිඟ කුලී ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | දීර්ඝ කාලයක් තිස්සේ පවතින රු.2,232,265 ක හිඟ බදු කුලී<br><br>ආදායම අයකර ගැනීම සඳහා |

| | | |
|---|---|---|
| | | නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

**2.2.4** උසාවි දඩ හා මුද්දර ගාස්තු
-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.3,980,599 ක් හා මුද්දර ගාස්තු රු.2,282,173 ක් විය. | අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු වටිනාකම් කාලපරිච්ඡේදයට අදාළ වටිනාකම් වන අතර කාලානුරූපීව එම ආදායම් සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාගැනීමට කටයුතු කරමි. |

**3** මෙහෙයුම් සමාලෝචනය
---------------------------

**3.1** කාර්යසාධනය
----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(i)** | සභා බල ප්‍රදේශය තුළ වර්ගීකරණයකින් තොරව කසළ එකතු කිරීම නිසා දෛනිකව ටොන් 02 කට අධික කසල ප්‍රමාණයක් පිළිසරු මධ්‍යස්ථානය තුළ සේවකයින් යොදවා වර්ග කිරීමට අමතර පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. | කසල වර්ගීකරණය කර සභාවට භාරදීමට ජනතාව පෙළඹවීමට කටයුතු කල යුතු වේ. | වර්ගීකරණය නොකරන ලද කසළ ලබාගැනීම ප්‍රතික්ෂේප කිරීම හා කසළ විධිමත්ව බැහැර නොකරන්නන්ට |

| | | | |
|---|---|---|---|
| | | | විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරමි. |
| **(ii)** | පිළිසරු මධ්‍යස්ථානය තුළ ඉදිකර ඇති ගොඩනැගිල්ලේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් දිරාපත්ව ඇති කොම්පෝස්ට් කුඩු කර ගැනීමට නොහැකිවීම මත දිනපතා පොහොර අලෙවි කිරීමට නොහැකිවෙන අවස්ථා පැවතුණි. | ඉල්ලුමට සරිලන සේ පොහොර නිෂ්පාදනය කර ආදායම වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිසරු මධ්‍යස්ථානය සඳහා අමතර ගබඩාවක් ඉදිකිරීමට සහා අරමුදල්හි ප්‍රතිපාදන නොමැති හෙයින් පළාත් පාලන දෙපාර්තමේන්තු වෙන් ප්‍රතිපාදන මුදල් ඉල්ලීම් කර ඇත. |

**(ආ)** තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ------------- |
| **(i)** | එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් හඳුන්වා දී තිබුණු තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව සභාව දැනුවත් වී තිබුණ ද එම අරමුණු අතරින් සභාවට අදාල අරමුණු නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. | අරමුණු හඳුනාගත යුතු වේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි. |
| **(ii)** | අයවැය සකස් කිරීමේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ දිනැති අංක 31 ජූලි 2017 BD/CBD/4/1/2-2018 චක්‍රලේඛයෙන් හඳුන්වා දී තිබුණු දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් නොතිබුණි. | උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි |
| **(iii)** | ඉලක්ක කරා ළඟාවීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා වූ සංධිස්ථානයන් හඳුනාගෙන නොතිබු බැවින් දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් නොතිබුණි. | දත්ත එක්රැස් කිරීමට කටයුතු කල යුතු වේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි |

| | | | |
|---|---|---|---|
| **(iv)** | 2016, 2017 හා 2018 වර්ෂවල තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම සඳහා අවශ්‍ය මූල්‍යප්‍රතිපාදන සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. | හඳුනාගෙන ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කළ යුතු වේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි |
| **(v)** | ඉලක්ක කරා ළඟාවීම සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ ක්‍රමවේදයන් නොපැවති අතර අරමුණු ඉටුකර ගැනීම සඳහා සම්බන්ධ කරගත යුතු අනෙකුත් රාජ්‍ය ආයතන හඳුනාගෙන නොතිබුණි. | පුහුණු කටයුතු නිසි පරිදි සිදුකළ යුතු වේ. | සියළු කාරණා පිළිබඳ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරමි |

**(ඇ)** ක්‍රියාකාරි සැලැස්ම
---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයය සඳහා සකස්කරන ලද ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ වැඩසටහන් 60 න් 21 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම මඟින් හඳුනාගත් සියලු වැඩසටහන් ක්‍රියාවට නැංවිය යුතු වේ. | 2019 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කරන ලද වැඩසටහන් සියල්ල ඉටුකිරීමට කටයුතු කරමි. |

**3.2** කළමනාකරණ අකාර්යක්ෂමතා
----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | සභා බල ප්‍රදේශයේ පරිසර බලපත්‍ර සඳහා අයදුම්පත්‍ර ලබාගෙන ඇති කර්මාන්ත 13 කින් 06 ක පරීක්ෂණ වාර්තා නිකුත් කර වසර 06 ත් 08 ත් අතර කාලයක් ගතවී තිබුණු නමුත් සුදුසු ආයතනවලට පරිසර බලපත්‍ර ලබා දී ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබාදිය හැකි කර්මාන්ත සඳහා පරිසර බලපත්‍ර ලබාදීමටත්, අනෙකුත් කර්මාන්ත අදාල නීති, රීතිවලට අනුකූල කරවා ගැනීමටත්, පරිසරයට හානි වන ආකාරයෙන් පවත්වාගෙන යනු ලබන කර්මාන්ත සම්බන්ධයෙන් | උපදෙස් ලබා දී ඇත. |

| | | | |
|---|---|---|---|
| | | නීතිමය පියවර ගැනීමටත් කටයුතු කල යුතු වේ. | |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු 86 කින් අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රචාරක දැන්වීම්වලින් ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | අනවසර දැන්වීම් පුවරු ගලවා ඉවත් කිරීමට හා අයවීමට ඇති දැන්වීම් පුවරු ගාස්තු සඳහා නීත්‍යානුකූල කටයුතු කිරීමට මේ වන විට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ ලද සියලු තැන්පත් ඇතුලත් කර තැන්පත් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණු අතර, ඒ හේතුවෙන් දෙසැම්බර් 31 වන විටත් නොගෙවා ඇති තැන්පත් ශේෂය පැහැදිලිව හඳුනාගත නොහැකි විය. | තැන්පත් ලේඛනය යාවත්කාලීනව පවත්වාගත යුතුය. | තැන්පත් ලේඛනය නිවැරදිව යාවත්කාලීන කරගන්නා ලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. |
| (ඈ) | වාහනයක අයිතිය සභාවේ නමට පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය සභාවේ නමට පවරාගැනීමට කටයුතු කල යුතුවේ. | 2019 වර්ෂය තුළ එම රථය පවරාගැනීමට කටයුතු කරමි. |

**3.3** මානව සම්පත් කළමනාකරණය
-----------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ----------- | ---------------- |
| (අ) | ප්‍රාදේශීය සභාවේ තෘතියික මට්ටමට අයත් ලේකම් තනතුර පුරප්පාඩුව පවතින අතර සමාලෝචිත වර්ෂයේ ජූලි මස සිට වැඩ බලන ලේකම්වරියක පත්කර තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කල යුතුවේ. | කාර්යය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | ද්විතියික මට්ටමට අයත් සංවර්ධන නිළධාරී තනතුරු 04ක්, පුස්තකාලයාධිපති තනතුරු 03ක්, කළමනාකරණ සහකාර තනතුරක් සහ වැඩ පරීක්ෂක තනතුරක් වශයෙන් තනතුරු 09 ක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කල යුතුවේ. | කාර්යය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇත. |
| **(ඇ)** | ප්‍රාථමික මට්ටමට අයත් ආයුර්වේද ඖෂධ සංයෝජක තනතුරක්, කාර්යාල කාර්ය සහායක තනතුරක්, පුස්තකාල කම්කරු තනතුරු 03ක්, ක්ෂේත්‍ර කම්කරු තනතුරක්, ජල කාර්මික තනතුරක් සහ සෞඛ්‍ය කම්කරු තනතුරක් වශයෙන් තනතුරු 08ක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කල යුතුවේ. | කාර්යය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇත. |

**3.4** මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ පිහිටි පුලස්තිගම හා තඹාල යන නගර දියුණු කල යුතු බවට ප්‍රකාශයට පත්කිරීමට තීරණය කර තිබුණද, ඊට අදාලව භූමි ප්‍රදේශය මැනුම් කර, සැලසුම් සකස් කරවා ගැනීමට සභාව අපොහොසත්වී තිබුණි. | දියුණු කල ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇති ප්‍රදේශයන්ගෙන් වරිපනම් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කල යුතුවේ. | පුලස්තිගම හා තඹාල යන නගර දියුණු කළ ප්‍රදේශයන් බවට පත් කිරීමට ඊට අදාළ භූමි ප්‍රදේශය හඳුනාගෙන මැනුම් කටයුතු අවසන්ව ඇත. |

**3.5** වත්කම් කළමනාකරණය

**3.5.1** නිෂ්ක්‍රීය/ඌණ උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | භාවිතයෙන් ඉවත්කර තිබූ රථ 06 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | භාවිතයට නොගන්නා වත්කම් අපහරණය කිරීමට කටයුතු කල යුතු වේ. | අපහරණය කළයුතු වත්කම් අපහරණය කිරීමට උපදෙස් ලබාදීඇත. |
| **(ආ)** | වටිනාකම් එකතුව රු.233,575 ක් වූ බ්ලොක් ගල් නිෂ්පාදන යන්ත්‍රය, කොන්ක්‍රීට් මිශ්‍රණය, ප්‍රොජෙක්ටරය සහ තලකම්පකය නිෂ්කාර්යව පැවතුණි. | සභාව සතු වත්කම් ප්‍රශස්ත ලෙස උපයෝජනය කල යුතුවේ. | අපහරණය කළයුතු වත්කම් අපහරණය කිරීමට උපදෙස් ලබාදී ඇත. |

**3.5.2** වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධනිත කල ගොඩනැගිලිවල වටිනාකම රු.2,104,403 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගත යුතු වේ. | ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදුනිමි. |

**3.6** අවිධිමත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීයාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | වර්ෂය තුළදී බැකෝ ලෝඩරය සභාවේ කටයුතු සඳහා ධාවනය නොකළ මීටර්පැය 184.4 සඳහා රු.3,500 බැගින් රු.645, 400 ක ආදායමක් ලැබිය යුතු වුවද ආදායම ලෙස අයකර ගෙන | වෙනසට හේතුව පරික්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | මීටර් පැය 28.2 ක් ලේඛනයේ සටහන් කර නොතිබුණු අතර |

| | | | |
|---|---|---|---|
| | ඇත්තේ රු.458,010 ක් පමණක් විය.මෙම වෙනසට හේතුව පැහැදිලි නොකෙරුණි. | | පිටපත් කිරීමේ දෝෂ 4.9 ක් හා අළුත්වැඩියාවක් හා සේවා කිරීම සඳහා පැය 30.1 යොදවා ඇත. |
| (ආ) | කඩ කාමර බදු දීමට අදාළව සම්පූර්ණ මුදලම ගෙවූ බවට ව්‍යාජ ලෙස ගිවිසුම් අත්සන් කර කඩකාමර බදුදීම සිදුකර තිබුණද, රු.901,500 න් ලබාගෙන ඇති මූලික තැන්පත් (key money) වටිනාකමරු. 335,000 වූ අතර රු. 566,500 ඇප අයකරගෙන නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශන තුලද අනාවරණය කර නොතිබුණි. | මූලික තැන්පතු මුදල් ලබාගැනීමෙන් අනතුරුව වත්කම් බදු දිය යුතු අතර හිඟ මුදල් අයකරගත යුතුවේ. | හිඟ තැන්පත් මුදල් අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු සිදුකරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. |

**4** ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------

**4.1** අභ්‍යන්තර විගණනය

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවේ ගනුදෙනු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරික්ෂාවක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකල යුතුවේ. | 2019 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර ඇති අතර විගණන කටයුතුද ආරම්භ කර ඇත. |

**4.2** විගණන හා කළමනාකරණ කමිටු

---------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක එන්සීපී/සී/එස්/01 විගණන හා 2016 මැයි 11 දිනැති ලිපිය මඟින් විගණන හා කළමනාකරණ කමිටු සෑම මාස 02 කට වරක් පැවැත්විය යුතු බව දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු නියමිත පරිදි පැවැත්විය යුතුවේ. | 2019 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වන බව දන්වමි. |